# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවා බණ්ඩය යටතේ වන **භෞත චිකිත්සක** තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

03. වැටුප් කේත අංකය - MT 6 – 2025

04. වැටුප් පරිමාණය - රු. 54,120-10x800-11x1,190-10x1,320-10x1,350
- රු.101,910/- (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුව)

05. බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

06. පුරප්පාඩු සංඛ්‍යාව - 01

07. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් -

7.1 සිංහල/ දෙමළ, ගණිතය , විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම

සහ

7.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතරෙන් විෂයයන් 02 ක් එකවර සමත්වීම

සහ

7.3 සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර දෙකක පූර්ණ කාලීන භෞත චිකිත්සක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ භෞත චිකිත්සකයෙකු ලෙස ලියාපදිංචි වී සිටීම

හෝ

7.4 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ භෞතචිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම

සහ

7.5 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ භෞත චිකිත්සකයෙකු ලෙස ලියාපදිංචි වී සිටීම

08. පළපුරුද්ද - පළපුරුද්ද අදාළ නොවේ

09. වයස් සීමාව - ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය

10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 02 | භාෂා ප්‍රවීනතාව | 20 | |
| 03 | පරිගණක සාක්ෂරතාවය | 20 | |
| 04 | අතිරේක වෘත්තීය පළපුරුද්ද | 35 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| **එකතුව** | | **100** | |

11. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

12. වෙනත් කරුණු -

12.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

12.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

12.3 සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

12.4 අදාළ උපාධිය හෝ ඩිප්ලෝමාව බල පැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර දිනයක් විය යුතුය.

12.5 අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

13. **අයදුම් කළ යුතු ක්‍රමය -**

13.1 A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කර මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 1 සිට 10 දක්වා පළමු පිටුවේද, අංක 11 සිට 13 දක්වා දෙවන පිටුවේද වනසේ) අයදුම්පත සකස් කර ගත යුතුය

13.2 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන, රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු/රු. 703,920/-ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය

13.3 නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 9 X 4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ "භෞත චිකිත්සක තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කර එම අයදුම්පත 2025 නොවැම්බර් 01 දින හෝ එදිනට පෙර **අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා වෛද්‍ය ආයතනය, නො.33, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය

**2025.09.29 දින**

**ක්‍රීඩා වෛද්‍ය ආයතනය,**
**නො. 33, මේට්ලන්ඩ් පෙදෙස,**
**කොළඹ 07.**

**වෛද්‍ය පී.එල්.කේ.ඒකනායක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ක්‍රීඩා වෛද්‍ය ආයතනය.**